# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2415/64 - 2024 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.12.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/76.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය.

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

ටී.එම්.ඩී.ඩී. කුමාරි මඩාටුව මිය, අංක. 03, පරාක්‍රම පාර, ගම්පහ.

*සහ*

HDFC බැංකුව, තැ.පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක. 40, ආචාර්ය කේ.ඒ. තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු**,
කම්කරු අමාත්‍ය .

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

1A - G 043323 - 14 (2024/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2023/76.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ටී.එම්.ඩී.ඩී. කුමාරි මඩාටුව මිය, අංක. 03, පරාක්‍රම පාර, ගම්පහ.

*සහ*

HDFC බැංකුව, තැ.පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"HDFC බැංකුවේ ජාඇළ ශාඛාවේ කළමනාකාරිණිය ලෙස සේවය කරන ටී.එම්.ඩී.ඩී. කුමාරි මඩාටුව මහත්මියට එම බැංකුවේ සිදු වී ඇති ව්‍යාජ රන් භාණ්ඩ උකස් ගැනීමක් සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව ඇයට ලබා දී ඇති විනය දඬුවම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0206

---

මගේ අංකය: IR/COM/01/2023/209.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය.

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. කේ.එම්.ආර්. සරත් කුමාර මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, කොට්ඨාස කාර්යාලය, තඹුත්තේගම.
2. කේ.ඒ.ඩී.ඩී.එස්.කේ.ඩබ්.ගුණරත්න මයා, අංක 24/ඒ, වික්‍රම මාවත, පාන්තිය, මතුගම.
3. අයි.එම්.අනුර බංඩාර මයා, සුභද මාවත, මාන්කඩවල, කැකිරාව.
4. එල්.ජී.ලලනා අයිරාංගනී මිය, අංක 1035/55, විශාඛා පාර, අනුරාධපුර.
5. ඩබ්.ඒ.සී.විජේසිංහ මයා, ''වක්ෂල'', අංක 46, පල්දෙනිය, මහවෙල.
6. ඒ.ටී.ඒ.එච්.ඩබ්. අළුත්වෙල මයා, අංක 07, හෙළ බොදුගම, ගල්නෑව.
7. ජේ.ඒ. සුනිල් රංජන්, අංක 3/18/01, මහවැලි කඳවුර, තඹුත්තේගම.
8. සී.පී.දිසානායක මයා, කොට්ඨාස කාර්යාලය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ගල්නෑව.
9. එල්. අරෝෂ් පෙරේරා මයා, අංක 621/5, ගොඩගේ මාවත, අනුරාධපුරය.
10. ඒ.එම්.නිමල් පියසිරි මයා, අංක 321, බටඅත, හුංගම.

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, 117, සිරි සිංගප්පුලි මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/209.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. කේ.එම්.ආර්. සරත් කුමාර මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, කොට්ඨාස කාර්යාලය, තඹුත්තේගම.
2. කේ.ඒ.ඩී.ඩී.එස්.කේ.ඩබ්.ගුණරත්න මයා, අංක 24/ඒ, වික්‍රම මාවත, පාන්තිය, මතුගම.
3. අයි.එම්.අනුර බංඩාර මයා, සුහද මාවත, මාන්කඩවල, කැකිරාව.
4. එල්.ජී.ලලනා අයිරාංගනී මිය, අංක 1035/55, විශාඛා පාර, අනුරාධපුර.
5. ඩබ්.ඒ.සී.විජේසිංහ මයා, ''වක්ෂල'', අංක 46, පල්දෙනිය, මහවෙල.
6. ඒ.ටී.ඒ.එච්.ඩබ්. අළුත්වෙල මයා, අංක 07, හෙළ බොදුගම, ගල්නෑව.
7. ජේ.ඒ. සුනිල් රංජන්, අංක 3/18/01, මහවැලි කඳවුර, තඹුත්තේගම.
8. සී.පී.දිසානායක මයා, කොට්ඨාස කාර්යාලය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ගල්නෑව.
9. එල්. අරෝෂ් පෙරේරා මයා, අංක 621/5, ගොඩගේ මාවත, අනුරාධපුරය.
10. ඒ.එම්.නිමල් පියසිරි මයා, අංක 321, බටඅත, හුංගම.

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''කේ.එම්.ආර්.සරත් කුමාර මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 10 දෙනා සඳහා,

1. ඔවුන් දැනට ලබන වැටුප නිවැරදිව ගණනය කර තිබේ ද යන්න හා එසේ ගණනය කර නොමැති නම් එමඟින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්,

2. ඔවුන්ව කාර්මික නිලධාරි තනතුරෙහි සිට, ඉංජිනේරු සහකාර තනතුර සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාවක් පවතී ද යන්න හා එසේ හැකියාවක් පවතී නම්, එය නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්,
3. 2014.05.28 දිනට වසර 03 ක් සම්පූර්ණ කර ඇති වෙනත් ඇතැම් සේවකයන් සඳහා ඔවුන්ට පෞද්ගලික වන සේ තාක්ෂණික ඉංජිනේරු ශ්‍රේණිය ලබා දී මෙම සේවකයින් 10 දෙනා සඳහා එවැනි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එලෙස අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

1. කේ.එම්.ආර්. සරත් කුමාර මයා.
2. කේ.ඒ.ඩී.ඩී.එස්.කේ.ඩබ්.ගුණරත්න මයා.
3. අයි.එම්.අනුර බංඩාර මයා.
4. එල්.ජී.ලලනා අයිරාංගනී මිය.
5. ඩබ්.ඒ.සී.විජේසිංහ මයා.
6. ඒ.ටී.ඒ.එච්.ඩබ්. අළුත්වෙල මයා.
7. ජේ.ඒ. සුනිල් රංජන් මයා.
8. සී.පී.දිසානායක මයා.
9. එල්. අරෝෂ් පෙරේරා මයා.
10. ඒ.එම්.නිමල් පියසිරි මයා.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12-0207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.